“ මා බුදුදහමටවත් කතෝලික දහමටවත් අයත් නැත. මා අයත් වන්නේ සත්‍යයටයි. මා දේශනා කරන්නේ සත්‍ය ගැනයි. බුද්ධ ධර්මය. කතෝලික, ටාඕ ධර්මය නැතිනම් වෙනත් නමකින් ඔබට එය හැඳින්විය හැකියි. ඒ සියළු දෙනාම මා දයාවෙන් පිළිගන්නවා”

අති උත්තම චිංග් හයි ශාස්තෘවරිය

“ අධ්‍යාත්මික සැනසුම ළඟාකර ගැනීමෙන් අපට අනික් සියළුම දේ ළඟාකර ගත හැක. එනම් සදාකාලික සාමය පිළිබඳ ආධ්‍යාත්මික අවබෝධය, සනාතන ප්‍රඥාව සහ සර්ව බල ශක්තිය ආදි වූ භෞතික හා දිව්‍යමයවූ සියළු ආභිප්‍රායන් දෙවියන්ගේ රාජධානියෙන් සපුරා ගත හැක. වස්තුව, බලය හෝ ඉහළ තනතුරු කොතෙක් තිබුනද අප මේ දේ ළඟාකර නොගතහොත් අපට කිසිදිනක සතුටු විය නොහැක.”

අති උත්තම චිංග් හයි ශාස්තෘවරිය.

“ අපගේ ඉගැන්වීම්වලින් කියවෙන්නේ ඔබ මේ ලෝකයේ කළයුතු කිසියම් දෙයක් ඇත්නම් එය මුළු හදින්ම කළ යුතු බවයි. වගකීම් පිළිබඳ අවබෝධයෙන් දිනපතා භාවනා කරන්න. මේ මගින් ඔබ වෙත වැඩි දැණුම වැඩි ප්‍රඥාව හා සාමය ළඟා කර ගත හැකි අතර ඉන් ඔබටත් ලෝකයටත් යහපතක් වෙයි. ඔබ තුළ සත්පුරුෂභාවය ඇති බව අමතක නොකරන්න. ඔබගේ සිරුර තුල දෙවියන් වැඩ වසන බව අමතක නොකරන්න. ඔබගේ හදවත තුළ බුදුන් වෙසෙන බව අමතක නො කරන්න.”

අති උත්තම චිංග් හයි ශාස්තාවරිය

# පෙරවදන

මිනිසාගේ ආධ්‍යාත්මික දියුණුව ඇති කිරීමේ උත්තරීතර පරමාර්ථය ඇතිව කාලාන්තරයක් තිස්සේ මනුෂ්‍ය වර්ගයා වෙත දුර්ලභ සනයේ පුද්ගලයන් සම්ප්‍රාප්ත වූ අතර යේසුස් වහන්සේ ඉන් එක් අයෙකි. ශාක්‍යමුනි බුදුරජාණන් වහන්සේ හා මොහම්මද් තුමා තවත් දෙදෙනෙකි. මේ උත්තමයන් තිදෙනාගේ නම් අප අතර ප්‍රචලිත මුත් අප නම් වශයෙන් නොහඳුනන එහෙත් එක් ජන කොටසකට පමණක් දේශනා පැවැත් වූ ඒ නිසාම එම ටිකදෙනා පමණක් දැන සිටි වෙනත් බොහෝ අය ද වූහ. මෙම පුද්ගලයන් එක් එක් කාලවල නා නා දේශවල ස්වාමිතුමා, දේව අවතාරය, ගැලවුම්කරුවා ශ්‍රාස්තෘ, දේව මාතාව, ශාන්තුවරයා, ගුරු, සත්‍ය අවබෝධ කර ගත් තැනැත්තා වැනි වචනවලින් හැඳින් විණ. සත්‍යාවබෝධය, ගැලවීම, විමුක්තිය, පිබිදීම, වැටහීම යන වචනවලින් හැඳින්වෙන දෙය ලබා දීම සඳහා ඔවුහු අප වෙත සම්ප්‍රාප්ත වූහ. අප පාවිච්චි කරන වචනවල සුළු වෙනස්කම් තිබිය හැකි මුත් අදහස් කරනුයේ එකම දෙයකි. අතීතයේ ගෞරවණීය තත්වයකට පත් වූ අය මෙන්ම සමාන දිව්‍යමය ප්‍රභවයකින්, ආධ්‍යාත්මික උතුම්බවින්, පිරිසිදු සිතෙන් මනුෂ්‍යත්වය ඉහළ නැංවීමේ බලයක් ඇතිව අද අප අතරට පැමිණ සිටින අය ගැන දන්නේ ටික දෙනෙකි. චින්ග් හයි ශ්‍රාස්තෘවරිය ඔවුන්ගෙන් එක් අයෙකි.

ශාස්තෘ චින්ග් හයි ජීවමාන ශාන්තුවරියක ලෙස ලොව පුරා පිළිගැණීමට ලක්වුවද බොහෝ බෞද්ධයෝ හා වෙනත් අය

ගැහැනියට බුදු විය නො හැකිය යන මිථ්‍යා මතයේ එල්බ ගෙන සිටිති. එතුමිය ආසියානු පෙලපතකට අයත් වන අතර බොහෝ බටහිර වැසියෝ තම ගැලවුම්කරුගේ බාහිර පෙණුම තමන්ගේ මෙන් විය යුතු යයි සිතති. කෙසේ වුවත් එතුමියගේ ඉගැන්වීම් අනුගමනය කළ, එතුමිය කවරෙක් ද යන වග හඳුනා ගන්නට ලැබුණු, එතුමියගේ කාර්ය කුමක් දැයි වටහා ගත් ලෝකය පුරා විසිර සිටින විවිධ ආගමික පසුබිම් ඇති අප වැන්නෝ එතුමිය වටා රොක් වන්නට වූහ. හදවතේ අවංක භාවයත් සිතේ විවෘත භාවයත් ඇති නම් ඔබට ද මෙම සත්‍යය පසක් කර ගත හැක. මේ සඳහා ඔබගේ කාලයත් අවධානයත් හැර වෙනත් යමක් අවශ්‍ය නොවෙයි.

මිනිස්සු තමන්ගේ කාලයෙන් වැඩි කොටසක් යැපීම සඳහාත් ලෞකික දේ ආරක්ෂා කර ගැනීම සඳහාත් වැය කරති. අපි අපේ ජීවිත හා අපේ සෙනහසට පාත්‍රවූවන්ගේ ජීවිත සැපවත් කිරීම සඳහා වෙහෙසෙමු. එහෙත් කාලය ලද විට අපි දේශපාලනය, ක්‍රීඩා, රූපවාහිනී නැතිනම් මෑතකදී කතාබහට ලක් වූ අපචාර කෙරෙහි අවධානය යොමු කරමු. දේවත්වය හා සෘජු අධ්‍යාත්මික සම්බන්ධකම් ඇති කර ගෙන මෛත්‍රියේ බලය අත්දැකීම්වලින් හිමිකර ගත් සමහරු ජීවිතයේ මීට වැඩි අර්ථවත් බවක් දකිති.

ශුභ ආරංචි පුළුල් වශයෙන් පැතිරී නො යාම කනගාටුවට කරුණකි. ජීවිතයේ සියළුම සට්ටනවලට විසඳුම් කාලය එන තුරු අප තුල සන්සුන්ව බලා සිටී. දෙව්ලොව පිහිටා ඇත්තේ හුස්ම පොදක දුරින් බව අපි දනිමු. බලවත් උද්‍යෝගය නිසා අප අතින් සිදුවන වැරදි හා සිහි බුද්ධියට විරුද්ධව කියවෙන දේ ගැන අපට සමාව ලැබේවා! අපි දුටු දේ හා අප දැනගත් දේ අපට දැකීමට හා දැන ගැනීමට ලැබෙන නිසා නිහඬව සිටීම අපහසුය.

චින්ග් හයි ශාස්තෘවරියගේ ගෝලයන් සහ ඇගේ ක්‍රමය (ක්වාන් යින් ක්‍රමය) අනුගමනය කරන්නන් වන අප මෙම කුඩා පොත ඔබ වෙත පිළිගන්වන්නේ ස්වකීය අත්දැකීම් මගින් සත්‍යාවබෝධකර ගැනීම සඳහා මග පෙන්වීමක් වශයෙනි. අපේ

ශාස්තෲවරිය හෝ වෙනත් කෙනෙකුගේ මාර්ගයෙන් එය සපුරා ගත හැක.

භාවනාව, මනසින් විමසීම හා යාඥාව පුහුණු කිරීමේ වැදගත්කම ගැන, චින්ග් හයි තුමිය උපදෙස් දෙයි. මෙම ජීවිතය සත්‍යවශයෙන්ම වාසනාවන්ත කර ගැනීමට නම් අප අපේ අධ්‍යාත්මික දිව්‍යමය ස්වභාවය හඳුනා ගත යුතු බව එතුමිය විස්තර කරයි. සත්‍යාවබෝධය කෙනෙකුට ග්‍රහණය කර ගත නොහැකි ගුප්ත දෙයක් නොවන බවත් ගිහි ජීවිතයෙන් ඈත් වූ අයට පමණක්ම ලබාගත හැකි දෙයක් නොවන බවත් ඇ පැහැදිළි කරයි. අපගේ සාමාන්‍ය ජීවිත එලෙසම පවතිද්දී අප තුළ ඇති දිව්‍යමය ස්වභාවය පුබුදු කිරිම එතුමියගේ කාර්යය යි. එතුමිය මෙසේ පවසයි. අපි හැම දෙනාම සත්‍යය දන්නවා. ඒත් ඒක අපට අමතක වෙලා. ඒ නිසා සමහර විට යම් කෙනෙකු ඇවිත් අපේ ජීවිතයේ පරමාර්ථය කුමක් ද, අපි සත්‍යය සෙවිය යුත්තේ මක් නිසාද, අපි භාවනා පුණුකළ යුත්තේ මක් නිසාද, අපි දෙවියන් හෝ බුදුන්, එසේත් නැතිනම් අපි හිතන කවුරු හෝ ලෝකයේ ඉහළම බලයක් ඇති තැනැත්තා විශ්වාස කළ යුත්තේ මක් නිසාද යනාදිය අපට මතක් කර දිය යුතුයි.

තමා අනුගමනය කරන ලෙස එතුමිය කිසිවකුගෙන් ඉල්ලා නොසිටී. අනෙක් අයටත් තම තමන්ගේ උතම් නිදහස ළඟාකර ගතහැකිබව පෙන්වා දීමට ඇය තම සත්‍යාවබෝධය උදාහරණයක් වශයෙන් ඉදිරිපත් කරයි.

මෙම කුඩා පොතෙන් චින්ග් හයි ශාස්තෲවරිය ගේ ඉගැන්වීම ගැන කෙටි හැඳින්වීමක් කෙරේ. මෙහි ඇතුළත් චින්ග් හයි ශාස්තෲවරියගේ දේශනා අදහස් සහ කථා කැසට්පටවලට කවා ඇති අතර පොත් වශයෙන් ද මුද්‍රණය කොට ඇත. සමහර විට වෙනත් භාෂාවලට ද පරිවර්ථනය කොට ඇත. වීඩියෝ හා කැසට්පට පරිහරණය කරන ලෙස අපි ඔබලාට උපදෙස් දෙන අතර, වචනින් ලියා ඇති දේට වඩා වැදගත් අත්දැකීම් මේ මගින් ලබා ගත හැකියි. ඇත්තවශයන් ඉහළම අත්දැකීම නම් ඇය සැබැවින් දැක ගැනීමයි.

සමහරෙකුට චින්ග් හයි ශාස්තෘවරිය මවකි. සමහරෙකුට පියෙකි. සමහරෙකුට ප්‍රියවන්තියෙකි. අධ්‍ුවශයෙන් මේ ලෝකයේ ඔබට සිටිය හැකි කල්‍යාණ මිතුරිය ඇයයි. ඇය මෙහි සිටින්නේ අපට දීමට මිස අපෙන් ගැනීමට නොවේ. ඇගේ කිසිම ඉගැන්වීමකට, උදව් දීමකට හෝ භාවනා උපදෙස් ලබා දෙන දේශනාවලට කිසිම මුදලක් අය නො කෙරේ. එතුමිය ඔබෙන් ගන්නා එකම දේ, ඔබේ විදිම්, ඔබේ දුක් කම්කටොලු හා වේදනා පමණයි. එය ද ඔබ කැමති නම් පමණි.